# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

15 MAY 2023
Western Provincial Public Service Commission

1. සම්බන්ධ වන ආයතන

| | | |
|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව | යොමු අංකය | දිනය |
| 1.2. අමාත්‍යාංශය - බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | යොමු අංකය - 1/6/25 (II) | දිනය - 2023.04. 25 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය- DMS/D/පොදු 11-2 | දිනය - 2012.12.19 |
| 1.4. ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය | යොමු අංකය CSWP/PTR/12-5/FI/3 | දිනය 2023.04.28 |
| 1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | දිනය |
| 1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය WPC/PSC/MNP/01/04/203 | දිනය 2023.06.22 |
| 1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය | දිනය |

2. පත්කිරීමේ බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/APM/6/7/373
දිනය : 2023/06/30

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය - කළමනාකරණ සහකාර අධිපත්‍යය

3.2. ශ්‍රේණි - අධි ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය-

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමාවන පරිදි අභ්‍යන්තර බඳවාගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවාගනු ලබන, ජ්‍යෙෂ්ඨ, විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4. කාර්යයන් පැවරීම -

මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

4. තනතුරේ ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය - MN 7- 2016

5.2. වැටුප් පරිමාණය - රු. 41580 -11x755-18x1030-68425

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| අධි | 04 | 43845/- |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | අධි ශ්‍රේණිය | 05 | 1. තමා සම්බන්ධීකරණය කරන ක්‍රීඩාවන් ව්‍යාප්ත කිරීමට සහ වැඩිදියුණු කිරීමට අදාළ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම<br>2. දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් හඳුනාගැනීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම<br>3. ක්‍රීඩාවට අදාළ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම (යටිතල පහසුකම්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, විනිසුරුවන් පිළිබඳ සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජයග්‍රහණ හා දක්ෂතාවන් පිළිබඳ)<br>4. අදාළ ක්‍රීඩාවන්ගේ සංවර්ධනය උදෙසා ක්‍රීඩා පුහුණුකරුවන් සමග සම්බන්ධීකරණය<br>5. ක්‍රීඩා පුහුණුකරුවන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීම සඳහා බස්නාහිර පළාත් ක්‍රීඩා විද්‍යායතනයේ සහයෝගයෙන් පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම<br>6. අදාළ ක්‍රීඩා සඳහා දිස්ත්‍රික් සංචිත අතර තරග පැවැත්වීම<br>7. ජාතික/දිස්ත්‍රික්/පළාත් ක්‍රීඩා සංගම්/ සම්මේලන සමග සම්බන්ධීකරණය, උපදේශනය හා අධීක්ෂණය |

ශගස/ADM/6/7/373
2023/06/30

| | | | |
|---|---|---|---|
| | | | 8. ක්‍රීඩා අමාත්‍යාංශයීය ක්‍රීඩා සංචිත පවත්වාගෙන යාම හා ඒ මගින් ජාතික සංචිත පෝෂණය කිරීම<br><br>9. ජාතික මහා ක්‍රීඩා උළෙලේ අදාළ තරග සංවිධානය<br><br>10. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන පවත්වනු ලබන වැඩසටහන්වල දී අවශ්‍ය සහාය ලබාදීම<br><br>11. ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්ගේ රාජකාරී අධීක්ෂණය කිරීම හා වගකීම් පැවරීම, උපදෙස් ලබාදීම, මගපෙන්වීම |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 05

7. බඳවාගැනීමේ ක්‍රමය -

7.1 බඳවාගන්නා ප්‍රතිශත

15 MAY 2023
...ial Public Service Commis...

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නැත |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නැත |

7.2 විවෘත බඳවාගැනීම - අදාළ නොවේ

7.3 සීමිත බඳවාගැනීම

7.3.1 බඳවාගන්නා පන්තිය - අධි පන්තිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් - අදාළ නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/6/7/373
දිනය : 2023/06/30

7.3.2.2 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

I. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම

හෝ

II. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ II ශ්‍රේණියේ වසර අටක (08) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම

හෝ

III. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ III ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගආ03/ADM/6/7/373
දිනය : 2023/06/30

සංලක්ෂය : මෙම පරිපාටිය අනුමත වන දිනට ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ වසර 08ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ට මෙම තනතුරට පළමු බඳවාගැනීම සඳහා පමණක් බලපාන පරිදි දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු සහ ජොෂ්ඨතාවය හා කුසලතාවය මත සුදුසු නිලධාරීන් තෝරාගනු ලැබේ.

7.3.2.3 කායික සුදුසුකම් - බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වියයුතුය.

7.3.2.4 වෙනත් සුදුසුකම් -

i. තනතුරේ ස්ථිර කර තිබීම
ii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව තිබීම
iii. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම
iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට 7.3.2.2 යටතේ දක්වා ඇති සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබියයුතුය
v. පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය

7.3.3 වයස - දැනට සේවයේ නියුතු නිලධාරීන්ගෙන් බඳවාගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවාගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය - අදාළ නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලන නිර්ණායක ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලැබේ.

15 MAY 2023

Public Service Commission

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | 30 |
| අතිරේක පුහුණු පාඨමාලා | 25 |
| ක්‍රීඩා පුහුණුකරු තනතුරේ දක්වන ලද විශේෂ දක්ෂතා | 20 |
| අමතර වෘත්තීය සුදුසුකම් | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 |
| එකතුව | 100 |

(ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ ඇමුණුම 01හි දක්වා ඇත)

7.3.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - පත්වීම් බලධාරියා

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - අභ්‍යන්තර දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා පදනම මත බඳවාගැනීම - අදාළ නොවේ.

8. කාර්යක්ෂමතා කඩඉම් - අදාළ නොවේ

9. භාෂා ප්‍රවීණතාව

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| a) රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය |
| b) අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.18/2020 හා අනුශංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය |
| c) සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නැත |

10. ශ්‍රේණි උසස් කිරීම - අදාළ නොවේ

11. තනතුරුවලට පත්කිරීම - අදාළ නොවේ

ගරු ආන්ඩුකාරතුමා ... අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/6/7/373
දිනය : 2023/06/30

**12.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූලා රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් ඉරගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළයුතුය.

**13.** **බස්නාහිර පළාත් සභා'රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

14.1 මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. දැනට සේවයේ යෙදී සිටින MN 03 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරට ස්ථිර පත්වීම් ලබා ඇති නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2 සේවා කාලය ගණනය කරනු ලබන්නේ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙන ය. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වියයුතුය. එසේ ම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදුනොකළ යුතුය.

**15.** **අර්ථ නිරූපණ:**

**"සතුටුදායක සේවා කාලය":**

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින් ද, සමත් වියයුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලු ම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදුනොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගපස/ADM/6/7/373
දිනය : 2022/06/30

(ii) නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළයුතු වන්නේය.

15 MAY 2023

**"සක්‍රීය සේවා කාලය":**

සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**"නියමිත දිනට" :**

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළයුතුය.

උදා : වසර තුනක දී සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස්වීම් ලැබෙනුයේ වසර එකොළහකිනි.

**16.** **මෙම පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වේනොත් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | :- ........................ | පරීක්ෂා කළේ | :- ........................ |
| නම | :- එච්.අයි.එස්. හේවාගම | නම | :- රවිකා රත්නායක |
| තනතුර | :- කළමනාකරණ සේවා නිලධාරී | තනතුර | :- පරිපාලන නිලධාරී |

රවිකා රත්නායක
පරිපාලන නිලධාරී
බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - 2023.04.25

අත්සන :- ........................ 25/04/23

නම :- එස්.ඩී.තෙවරප්පෙරුම

තනතුර :- අධ්‍යක්ෂ (ක්‍රීඩා)

නිලමුද්‍රාව

එස්.ඩී.තෙවරප්පෙරුම
ක්‍රීඩා අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික හා කලා කටයුතු,ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
2 වන මහල,නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල

ගරු ආණ්ඩු... අනුමත කරන ලදී.
ගොනු අංකය: ගOS/ADM/6/7/373
දිනය : 2023/06/30

යොමුඅංකය- 1/6/25(II)

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2023.04. 25

අත්සන :- ..........................................

නම :- සිරිසෝම ලොකුවිතාන

තනතුර :- ලේකම්

නිලමුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අ... පුස්තකාල හා කලා කටයුතු, ක්‍රීඩා හා යොවුන් කටයුතු සහ තොරතුරු තාක්ෂණ සිවිල් අමාත්‍යාංශය
2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
අංක. 204, ඩෙනිසිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

යොමු අංකය - CS/WP/PTR/12-8/F1/3

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2023/04/26

අත්සන :- ..........................................

නම :- ..........................................

ප්‍රධාන ලේකම්

නිලමුද්‍රාව

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමුඅංකය-..........................................

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය - 23/06/22

අත්සන :- ..........................................

නම :- ..........................................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

නිලමුද්‍රාව

යොමු අංකය- ..........................................

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය 2023. 06. 30 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය - 2023. 06. 30

අත්සන :- ..........................................

නම :- ..........................................

ආණ්ඩුකාර ලේකම්

නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය
10 වන මහල, පළාත් සභා සංකීර්ණය
අංක. 204, ඩෙනිසිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/6/7/373
දිනය : 2023/06/30

ඇමුණුම 01

15 MAY 2023

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවාගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

1. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවාගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | | ලබා දියයුතු උපරිම ලකුණු ප්‍රමාණය | සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | තනතුරට බඳවාගැනීමට සලකා බලනු ලබන සේවා කාලයට අතිරේකව සේවය කර ඇති කාලය සඳහා වසරකට ලකුණු 3 බැගින් උපරිම වසර 10 | | 30 | |
| අතිරේක පුහුණු පාඨමාලා | I. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 03ට අඩු ක්‍රීඩා පාඨමාලා<br>(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දේ) | 04 | 25 | අදාළ නොවේ |
| | II. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 03ට වැඩි ක්‍රීඩා පාඨමාලා<br>(එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දේ) | 06 | | |
| | III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා | 08 | | |
| | IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන උසස් ක්‍රීඩා ඩිප්ලෝමා | 10 | | |
| | V. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා කළමනාකරණ හෝ පරිපාලනය හෝ ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධිය | 15 | | |
| | VI. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා කළමනාකරණ හෝ පරිපාලනය හෝ ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 25 | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගසෙ/ADM/6/7/373
දිනය : 2023/06/30

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (බඳවාගැනීමට සුදුසුකම් ලබන මූලික අවශ්‍යතාවය ලෙස නිලධාරියා සම්පූර්ණ කර ඇත්තේ මෙම පරිපාටියෙහි 7.3.2.2හි III වගන්තියෙහි අවශ්‍යතාව පමණක් නම් එහි සඳහන් උපාධිය සඳහා නැවත ලකුණු ලබාදෙනු නොලැබේ)<br>• ඉහත ලකුණු ලබාදීමේදී ලබා ඇති ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | | | | | |
| ක්‍රීඩා පුහුණුකරු තනතුරේ දක්වන ලද විශේෂ දක්ෂතා | I. ක්‍රීඩා පුහුණුකරුවෙකු ලෙස ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් තමා විසින් සිදුකරන ලද නිර්මාණාත්මක පර්යේෂණාත්මක නව වැඩසටහන් පිළිබඳ ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන තොරතුරු මත ලකුණු ලබාදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත. | | | 10 | 20 | |
| | II. ක්‍රීඩා පුහුණුකරුවෙකු ලෙස ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් දක්වන ලද දක්ෂතා | | උපරිම ලකුණු | 10 | | |
| | a) ජාතික මට්ටමේ තරගාවලියකදී ප්‍රථම ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 04 | 04 | | | |
| | b) ජාතික මට්ටමේ තරගාවලියකදී දෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 02 | | | | |
| | c) ජාතික මට්ටමේ තරගාවලියකදී තෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 01 | | | | |
| | d) දකුණු ආසියාතික මට්ටමේ තරගාවලියකදී ප්‍රථම ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 06 | 06 | | | |
| | e) දකුණු ආසියාතික මට්ටමේ තරගාවලියකදී දෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 04 | | | | |
| | f) දකුණු ආසියාතික මට්ටමේ තරගාවලියකදී තෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 02 | | | | |
| | g) ආසියානු හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා තරගාවලියකදී ප්‍රථම ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 08 | 08 | | | |
| | h) ආසියානු හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා තරගාවලියකදී දෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 06 | | | | |
| | i) ආසියානු හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා තරගාවලියකදී තෙවන ස්ථානය ලබාගත් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | 04 | | | | |
| | j) ඔලිම්පික් තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කල ක්‍රීඩකයෙක් පුහුණුකිරීම | | 10 | | | |

GOS/ADM/6/7/373

2023/06/30

| | | | | |
|---|---|---|---|---|
| | • කණ්ඩායම් තරග සඳහා ලකුණු ලබාදීමේදී කණ්ඩායම නියෝජනය කර ඇති එක් ක්‍රීඩකයෙක් පුහුණුකිරීම වෙනුවෙන් මෙම ලබා දී ඇති ලකුණු ප්‍රමාණයෙන් 50%ක් පමණක් ලබා දෙනු ලැබේ.<br>• උපරිම ලකුණු ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි ඕනෑම ක්‍රීඩකයින් සංඛ්‍යාවක් පුහුණු කිරීම සඳහා ලකුණු ලබාදිය හැකිය.<br>• මෙම ක්‍රීඩා ප්‍රයගුහණ ක්‍රීඩක/ක්‍රීඩිකාවගේ සහතිකයේ සහතික කළ පිටපතක් ද සමග අදාල ක්‍රීඩා සංගමයේ ලිපි ශීර්ෂයෙන් නිකුත් කර ඇති ලිපියක් මගින් සනාථ කලයුතුය. | | | |
| අමතර වෘත්තීය සුදුසුකම් | I. ජාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම<br>(එක් අවස්ථාවක් සඳහා ලකුණු 03 බැගින් උපරිම අවස්ථා 02)<br>II. දකුණු ආසියාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම<br>(එක් අවස්ථාවක් සඳහා ලකුණු 05 බැගින් උපරිම අවස්ථා 02)<br>III. ආසියාතික/පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා/ ඔලිම්පික් මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම<br>(ඉහත සියලු අවස්ථා සඳහා පිළිගත හැකි ලිඛිත සහතික/ලිපි ඉදිරිපත් කල යුතුය) | 06<br>10<br>20 | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | | | 05 | |

සටහන : ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලයලත් ආයතනයක් / පුද්ගලයන්

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

අත්සන :-
නම :- සිරිසෝම ලොකුවිතාන
තනතුර :- ලේකම්
දිනය :- 2023.04. 25
නිලමුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය

15 MAY 2023
ගොනු අංකය : GOS/ADM/617/373
දිනය : 2023/06/30